අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය
நீதி, பொது நிருவாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள், உள்ளூராட்சி மற்றும் தொழில் அமைச்சு
Ministry of Justice, Public Administration, Home Affairs, Provincial Councils, Local Government and Labour

අධිකරණ අංශය
நீதிப் பிரிவு
Justice Division

නො 19, ශ්‍රී සංඝරාජ මාවත, කොළඹ 10, ශ්‍රී ලංකාව.
இல 19 ஸ்ரீ சங்கராஜ மாவத்த, கொழும்பு 10, இலங்கை.
No 19, Sri Sangaraja Mawatha, Colombo 10, Sri Lanka

19 NOV 2024

මගේ අංකය / எனது இல / My No: MOJ/L8/05/01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2024.11.13

ලේකම්
අධිකරණ සේවා කොමිෂන් සභාව
කොළඹ -12.

**තලංගම සෙත් සෙවණ මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 2024.10.18 වන දින සිදුකරන ලද නිරීක්ෂණ චාරිකාව සහ නවදිගන්තය මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 2024.06.25 වන දින සිදුකරන ලද නිරීක්ෂණ චාරිකාව සම්බන්ධව**

උක්ත කරුණට අදාළව ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ ලේකම් විසින් මෙම අමාත්‍යාංශය දැනුවත් කර ඇති අංක HRC/RM/NPM/THA/02/2024 හා 2024.10.21 දිනැති ලිපිය හා බැඳේ.

2. එකී ලිපියේ සඳහන් කර ඇති කරුණුවලට අනුව 2024.10.08 දින හා 2024.06.25 දිනයන්හි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරීන් ඉහත සඳහන් කළ පුනරුත්ථාපන මධ්‍යස්ථාන වෙත නිරීක්ෂණය කිරීමෙන් අනතුරුව පුනරුත්ථාපනලාභීන් විශාල පිරිසකට පුනරුත්ථාපන කටයුතු සිදුකිරීම සඳහා එම මධ්‍යස්ථාන තුළ ඉඩකඩ ඇති බැවින් ඉහත සඳහන් කළ පුනරුත්ථාපන මධ්‍යස්ථානවලින් පුනරුත්ථාපනය කිරීම කෙරෙහි ප්‍රමුඛ අවධානය යොමු කරන ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව විසින් වැඩිදුරටත් දන්වා ඇත.

3. ඉහත කරුණු කෙරෙහි මහේස්ත්‍රාත්වරුන්ගේ අවධානය යොමු කරන්නේ නම් මැනවි.

පියුමන්ති පීරිස්
අතිරේක ලේකම් (නීති)
ලේකම් වෙනුවට
අධිකරණ, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා, පළාත් පාලන සහ කම්කරු අමාත්‍යාංශය

පිටපත්:-

| | | |
|---|---|---|
| 1. | අධ්‍යක්ෂ<br>ශ්‍රී ලංකා විනිසුරුවරුන් පුහුණු කිරීමේ ආයතනය, කොළඹ 12. | - මේ පිළිබඳව ගරු මහේස්ත්‍රාත්වරුන් දැනුවත් කර අවශ්‍ය ඉදිරි කටයුතු ගැනීම සඳහා |
| 2. | බන්ධනාගාර කොමසාරිස් ජනරාල්<br>බන්ධනාගාර මූලස්ථානය | - කරු. අවශ්‍ය කටයුතු සඳහා සහ දැ.ගැ.ස. |
| 3. | ලේකම්, ශ්‍රී ලංකා මා.හි.කො.සභාව<br>අංක 14, ආර්.ඒ ද මෙල් මාවත, කොළඹ 04. | - ඔබගේ අංක HRC/RM/NPM/THA/02/2024 හා 2024.10.21 දිනැති ලිපිය සම්බන්ධව කරු. දැ.ගැ.ස. |

99

RECEIVED
30 OCT 2024
Prison Affairs Division
Ministry of Justice, Prison Affairs and Constitutional Reforms

RECEIVED
25 OCT 2024

# ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව
# இலங்கை மனித உரிமைகள் ஆணைக்குழு
# HUMAN RIGHTS COMMISSION OF SRI LANKA

| | | |
|---|---|---|
| මගේ අංකය<br>எனது இல.<br>My No. | HRC/RM/NPM/THA/02/2024 | |
| ඔබේ අංකය<br>உமது இல.<br>Your No. | | |
| දිනය<br>திகதி<br>Date. | 2024.10.21 | |

ලේකම්,

අධිකරණ අමාත්‍යාංශය

<u>තලංගම සෙත් සෙවණ මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 2024.10.18 වන දින සිදුකරන ලද නිරීක්ෂණ චාරිකාව සහ නවදිගන්තය මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානයේ 2024.06.25 වන දින සිදුකරන ලද නිරීක්ෂණ චාරිකාව සම්බන්ධව</u>

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධි විධාන නිසි ලෙස ක්‍රියාකරනු ලබන බවට සහතික කිරීමේ අදහසින් එම නීතීන් හා අයිතිවාසිකම් වලට ගරු කිරීම, ප්‍රවර්ධනය කිරීම පිණිස විධායක, පරිපාලනමය පිළිවෙත් පිළිබඳ සුපරීක්ෂාවෙන් සිට නීතිමය හා පරිපාලනමය කාර්යය පටිපාටීන් සකස්කිරීමෙහිලා රජයට අවශ්‍ය උපදෙස් ලබාදීම, සහායවීම සහ එම කාර්යය නිසි පරිදි අදාළ ආයතන විසින් ක්‍රියාත්මක කරන්නේ ද යන්න පිළිබඳව හා ඉහත අවශ්‍යවන්නා වූ සියලු දේ කිරීමට ප්‍රතිපාදන 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව හිමි ව ඇත.

02. 2022 වසරේ සිට ජාතික වධහිංසා වැළැක්වීමේ යාන්ත්‍රණය ලෙස ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව කටයුතු කරන අතර ඒ අනුව සියලුම ආකාරයේ ආයතනගත රැඳවියන් වධහිංසාවෙන් වළක්වාගැනීම සම්බන්ධයෙන් වඩාත් ක්‍රියාකාරීව කටයතු කරනු ලැබේ. එම යාන්ත්‍රණය මඟින් ශ්‍රී ලංකාව තුල සිටින සියලු නිදහස අහිමි කර ඇති තැනැත්තන් රඳවා සිටින ස්ථාන පරීක්ෂා කර, රැඳවීමේ තත්වය විමසීමත්, ඔවුන්ට වධහිංසා සිදුවීමට පවතින අවකාශය වැළැක්වීම සඳහා අවශ්‍ය නිර්දේශ නිකුත් කිරීමත් මෙමඟින් සිදුකරනු ලැබේ.

03. ඒ අනුව 2024.10.08 වන දින සහ 2024.06.25 වන දිනයන්හි ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ නිලධාරින් කණ්ඩායමක් තලංගම සෙත් සෙවණ මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානය සහ නවදිගන්තය මත්ද්‍රව්‍ය පුනරුත්ථාපන මධ්‍යස්ථානය වෙත පැමිණි අතර, එම මධ්‍යස්ථාන තුළින් නිරීක්ෂණය වූ කරුණක් වූයේ පුනරුත්ථාපනලාභීන් විශාල පිරිසක් පුනරුත්ථාපනය කිරීම වෙනුවෙන් එම මධ්‍යස්ථාන පරිශ්‍රයන් තුළ ඉඩ ප්‍රස්තාවන් පවතින බවයි. එබැවින් පුනරුත්ථාපනය කිරීමේදී මෙම ආයතන කෙරෙහි ප්‍රමුඛතාවය ලබාදීම වෙනුවෙන් අවධානය යොමු කරන මෙන් දන්වා සිටිමි.

04. තවද ඒ සම්බන්ධයෙන් ඔබ ආයතනය මඟින් ගනු ලබන ක්‍රියාමාර්ග පිළිබඳ සවිස්තර වාර්තාවක් <u>2024.10.30</u> වන දින හෝ ඊට පෙර ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ පර්යේෂණ හා අධීක්ෂණ අංශයේ අධ්‍යක්ෂ වෙත ලැබීමට සලස්වන මෙන් වැඩිදුරටත් දන්වා සිටිමි.

මෙම දැන්වීම කරනුයේ 1996 අංක 21 දරණ ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභා පනත ප්‍රකාරව බව වැඩිදුරටත් දන්වමු.

ලේකම් (වෙනුවට),
ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

නීති අංශය
14
30 OCT 2024
අධිකරණ අමාත්‍යාංශය


| | | | |
|---|---|---|---|
| ප්‍රධාන කාර්යාලය<br>பிர அலுவலகம்<br>H ffice | අංක 14, ආර්. ඒ. ද මෙල් මාවත කොළඹ -04.<br>இல. 14, ஆர்.ஏ.த.மெல் மாவத்தை, கொழும்பு -04.<br>No. 14, R.A.De Mel Mawatha, Colombo -04. | සභාපති<br>தவிசாளர்<br>Chairman | 011- 2505451 |
| ෆැක්ස්<br>தொலைநகல்<br>Fax | 011- 2505541/74 | ඊමේල්<br>மின்னஞ்சல்<br>e-mail | sechrcsl@gmail.com |
| දුරකථන<br>தொலைபேசி<br>Telephone | 94-11-2505580 / 81 /82 | ලේකම්<br>செயலாளர்<br>Secretary | 011- 2505521 |
| ක්ෂණික<br>துரித அழைப்பு<br>Hotline | 1996 | වෙබ්<br>இணையம்<br>Web | www.hrcsl.lk |